Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

### සමාජ වැඩ පිළිබඳ දැවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලාව

### සිංහල මාධ්‍යය/දෙමළ මාධ්‍යය - 2020/2021

සමාජ වැඩ පිළිබඳ දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ සමාජ සේවා, සමාජ සුභසාධන හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය විද්‍යාත්මක දනුම, කුසලතා හා ආකල්පවලින් පිරිපුන් සමාජ වැඩ වෘත්තිකයින් බිහි කිරීමයි.

01. *ඇතුළත්වීමේ සුදුසුකම් :*

(i) අ.පො.ස. (උසස් පෙළ) සමත්වීම (විෂයයන් 03 සඳහා සාමාර්ථ ලබාගැනීම); හෝ

(ii) (අ) රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරක හෝ වැඩි ගණනක අවුරුදු 03කට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම

- (i) සමාජ සේවා දෙපාර්තමේන්තුව හා පළාත් සභාවල සමාජ සේවා නිලධාරි;
- (ii) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි, සහතික කල පාසල්වල පාසල්පති, නිවාසාචාර්ය හා උපනිවාසාචාර්ය, ළමාරක්ෂක නිලධාරි;
- (iii) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජේලර් හා සුභසාධන නිලධාරි;
- (iv) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ග්‍රාම නිලධාරි;
- (v) ජාතික තරුණ සේවා නිලධාරි (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) හා සහකාර තරුණ සේවා නිලධාරි;
- (vi) කර්මාන්ත හා වැවිලි ක්ෂේත්‍රයේ රාජ්‍ය නීතිගත සංස්ථා, මණ්ඩල, පෞද්ගලික අංශයේ ප්‍රජා සංවර්ධන නිලධාරි, සුභසාධන නිලධාරි;
- (vii) සමෘද්ධි සංවර්ධන නිලධාරි, කෘෂි නිෂ්පාදන හා පර්යේෂණ සහකාර;
- (viii) මුල් ළමාවිය සංවර්ධන නිලධාරි;
- (ix) කාන්තා සංවර්ධන නිලධාරි;
- (x) සංවර්ධන සහකාර (සමාජ සේවා දෙපාර්තමේන්තුව);
- (xi) උපදේශන නිලධාරි;
- (xii) ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි;
- (xiii) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි;
- (xiv) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා පළාත් සභාවල ගුරුවරුන්;
- (xv) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ධීවර සමාජ සංවර්ධන සහකාර;
- (xvi) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක, මහජන සෞඛ්‍ය හෙද/හෙදි නිලධාරීන්, මනෝ වෛද්‍ය සමාජ සේවක;
- (xvii) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන කොමිෂන් සභාවේ ප්‍රජා මණ්ඩල නිලධාරි, පළාත් පාලන නිලධාරි, සහන නිලධාරි;
- (xviii) රජයේ හෝ රජයේ නොවන හෝ පෞද්ගලික අංශයේ ආයතනවල හෝ සමාන තනතුරු දරන නිලධාරීන්;
- (xix) මානසික සෞඛ්‍ය සංවර්ධන සහකාර නිලධාරි (සෞඛ්‍ය අමාත්‍යාංශය);
- (xx) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යාපන සභාවේ අනුමැතියට යටත්ව ඉහත සඳහන් සුදුසුකම් හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

*සටහන :*

(i) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් හෝ සමාජ සුභසාධන/සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් තිබෙන අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

02. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 20ට නොඅඩු සහ අවුරුදු 46ට නොවැඩි විය යුතුය.

03. *වෙනත් කොන්දේසි :*

(i) රැකියාවල නියුතු හෝ දැනටමත් වෙනත් පාඨමාලා හදාරන අය ද්වෛවර්ෂ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පාඨමාලාවට බැඳීමට අදහස් කරන්නේ නම්, වර්ෂ දෙකක කාලයක් සඳහා නිවාඩු ලබාගැනීම අත්‍යාවශ්‍ය වන අතර, නිවාඩු ලබාගැනීමේ සම්පූර්ණ වගකීම අයදුම්කරු සතු වේ. පාඨමාලාවේ ලියාපදිංචියට පෙර අධ්‍යයන නිවාඩු ලබාගත යුතුය.

(ii) පාඨමාලාවේ කාලසීමාව තුළ දී වෙනත් පූර්ණකාලීන පාඨමාලාවක් හැදෑරීමට අවසර නොමැති අතර, වෙනත් පාඨමාලාවක් හදාරන බව හෙළිවුවහොත් මෙම පාඨමාලාවෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

04. ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියට පමුණුවනු ලැබේ. අවසාන තීරණය ගනු ලබන්නේ ආයතනයේ බඳවාගැනීමේ මණ්ඩලය විසිනි.

05. *පාඨමාලාව පැවැත්වෙන මාධ්‍යය .-* සිංහල/දෙමළ

06. *අයදුම්පත් .-* මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2021.05.17 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරි, ජාතික සමාජ සංවර්ධන ආයතනය, ලියනගේමුල්ල, සීදුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර පැමිණ ද ලබාගත හැකිය. දැනට රැකියාවල නියුක්ත

අයදුම්කරුවන් අයදුම්පත් එවිය යුත්තේ තම සේව්‍යයාගේ මාර්ගයෙනි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය ඉක්මවා ලැබෙන සියලුම අයදුම්පත් ද, නියමිත සුදුසුකම් සපුරා නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ශාමිණී අත්තනායක,
අධ්‍යක්ෂ ජනරාල් (*වැ.බ.*)
ජාතික සමාජ සංවර්ධන ආයතනය

2021 අප්‍රේල් මස 16 වැනි දින,
ලියනගේමුල්ල,
සීදූව,
ජාතික සමාජ සංවර්ධන ආයතනයේදී ය.

ආදර්ශ අයදුම්පත

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

සමාජ වැඩ පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව

**සිංහල මාධ්‍යය/දෙමළ මාධ්‍යය - 2020/2021**

| | |
|---|---|
| | |
| | |
| | |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. මුලකුරු සමග නම ඃ
(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

04. විවාහක/අවිවාහක බව :————.

05. උපන් දිනය ඃ
2021.05.17 වැනි දිනට වයස ඃ අවුරුදු :————.මාස :————. දින :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. ලිපිනය (පෞද්ගලික) ඃ
(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

ලිපිනය (රාජකාරි)
(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
දුරකථන අංකය :————.

08. පදිංචි දිස්ත්‍රික්කය :————.

09. පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

10. පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන මාධ්‍යය :
(සිංහල/දෙමළ) :————.

11. අධ්‍යාපන සුදුසුකම් :

| *සමත් වූ විභාගය* | *විෂයයන්* | *සාමාර්ථය* | *විභාගයට පෙනීසිටි වර්ෂය සහ විභාග අංකය* | *මාධ්‍යය* | *විභාගයට පෙනී සිටි දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|---|
| 01. අ.පො.ස. (සා.පෙළ)/ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර | 01.<br>02.<br>03.<br>04.<br>05.<br>06.<br>07.<br>08. | | | | |
| 02. අ.පො.ස. (උ/පෙළ) | 01.<br>02.<br>03.<br>04. | | | | |

| විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට අවම සුදුසුකම් ලබා තිබුණේද? ඔව්/නැත | | | |
|---|---|---|---|
| 03. උපාධිය : | | | |
| *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය හා මාධ්‍යය* | *විශ්වවිද්‍යාලය* |
| 01.<br>02.<br>03.<br>04. | | | |

12. වෙනත් අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

13. දැනට නියුතු රැකියාව හා කලින් නියුක්තව සිටි රැකියා :

| *දෙපාර්තමේන්තුව/ආයතනය* | *තනතුර* | *කාලසීමාව* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| 01.<br>02.<br>03.<br>04. | | | |

14. වෙනත් සුදුසුකම් :
(සමාජ සුභසාධනය පිළිබඳ ලබා ඇති පළපුරුද්ද, සමාජ සේවා සංවිධානවල දරා ඇති නිලතල, විශේෂ දක්ෂතා හා රුචිකත්වයන් පිළිබඳ සඳහන් කරන්න. (අවශ්‍ය නම් වෙනත් පත් ඉරුවක් අමුණන්න).

15. දැනට වෙනත් පාඨමාලාවන් කිසිවක් හදාරන්නේ නම් විස්තර දක්වන්න.

..........................................................................................

16. මෙම පාඨමාලාව තෝරාගැනීමට හේතු :
මා විසින් ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බව සහතික කරමි. තෝරාගැනීමෙන් අනතුරුව ඉන් කිසිවක් අසත්‍ය බව පෙනී ගියහොත් පාඨමාලාවෙන් මා නෙරපා හරිනු ලැබීමට යටත්වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

..........................හිමි/මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. අයදුම්කරුගේ ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි ය. ඔහු/ඇය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා වැටුප් සහිත/රහිත නිවාඩු පිට මුදා හැරිය හැකිය.

————,
දෙපාර්තමේන්තුවේ/
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
පදවි නාමය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.
නිල මුද්‍රාව :————.